# සත්තරසමො පාඨො

බුද්දකනිකායට අයත් ග්‍රන්ථ මාලාවේ තෙළෙස් වන ග්‍රන්ථය අපාදානපාළියයි. පූර්වයේ කරන ලද කුශලානුභාවයෙන් ජනිත වූ උදාර චරිතයක් පූර්වේනිවාසානුස්මෘතියෙන් හෙවත් පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණින් දැක අතීත වෘත්තාන්ත වශයෙන් ගෙනහැර දැක්වීම අපදාන ශබ්දයේ අර්ථය යි. අපදාන ශබ්දය කරණ, ග්‍රහණ, අපගමන, පටිපාටි, ආක්‍රෝෂණ යනාදි අර්ථ කීපයක වැටෙයි. මෙහි අපදාන ශබ්දය වැටෙනුයේ කරණාර්ථයේ ය. ඒ අනුව බුදුවරුන්ගේ අපදානයෝ බුද්ධාපදානයෝ ය. බුද්ධකාරක නම් පාරමිතා ධර්ම ඒ අනුව සම්බුදු, පසේබුදු, මහරහත් යන ආර්යයන් වහන්සේලාගේ මුලින්වූ පාරමිතා පිරීමේ සිද්ධියට වූ කාරණය අපදානය නම් වේ.

නවාංගසත්ථුසාසනයෙහි ගාථාංගයෙහි ලා අපදාන ඇතුළත් කෙරේ. නවාංග සත්ථුසාසනය යනු බුද්ධවචනය වර්ගීකරණය කළ ඉපැරැණි ක්‍රමයකි. අර්ථකථාචාර්යයන් වහන්සේලාගේ විග්‍රහයට අනුව නවාංගසත්ථුසාසනය මෙසේ ය. **සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල** යනුවෙනි.

අපදාන ප්‍රධාන වශයෙන් කොටස් 04 කි.

1. **බුද්ධාපදාන**
2. **පච්චෙක බුද්ධාපදාන**
3. **ථෙරාපදාන**
4. **ථෙරී අපදාන** වශයෙනි.

අපදානපාළියෙහි වර්ග 65 ක් පමණ වේ. අපදාන 592 ක් ඇත. ගාථා 7619 ක් ඇත. බුද්ධාපදාන 1 ක් පච්චෙක බුද්ධාපදාන 1 ක් ථෙරාපදාන 550 ක් හා ථෙරී අපදාන 40 ක් මෙහි ඇතුළත් ය. සම්පූර්ණ අපදානපාළිය පද්‍යයෙන් රචනා වී ඇත.

අපදානපාළිය ථෙර ථෙරීන්ගේ අතීත චරිත කථා දක්වනු පිණිස රචනා වී ඇත. ථෙර ථෙරීගාථාවන්හි ප්‍රධානත්වය ලැබී ඇත්තේ ථෙර ථෙරීන්ගේ වර්තමාන චරිත සම්බන්ධ සිද්ධීන් පැහැදිලි කිරීමට ය. ගිහි ජීවිත යේ දුක්බර සිද්ධි, ඒවායෙන් අතමිදී පැවිද්ද ලැබීම, පැවිද්දේ ඇති නිරාමිස ප්‍රීතිය එහි විස්තර වේ. අපදානපාළියෙහි විස්තර වන්නේ වර්තමාන චරිතයේ ප්‍රභවයට හේතු වූ අතීත භවයන්හි කළ කුශලාකුශල ක්‍රියාවන් ය. වර්තමාන චරිත සිද්ධි ද විස්තර වේ. සර්වාස්තිවාදී නිකායෙහි **අවදානශතක, දිව්‍යාවදාන** වැනි ග්‍රන්ථවල ද බුද්ධ කාලීන හා පශ්චාත්කාලීන තෙරවරුන්ගේ චරිත අන්තර්ගත වෙයි.

**ථෙරී අපදාන හා ගෝතමී ථෙරී අපදානය**

ථෙරී අපදානය වර්ග 4 කින් හා අපදාන 40 කින් සමන්විත ය. එහි වර්ග 4 මෙසේ ය.

1. **සුමෙධා වර්ගය**
2. **එකුපොසථික වර්ගය**
3. **කුණ්ඩලකෙසී වර්ගය**
4. **ඛත්තියා වර්ගය** වශයෙනි.

ඉන් මහා ප්‍රජාපතී ගෝතමී අපදානය ඇතුළත් වන්නේ එකුපෝසථික වර්ගයට ය. එම වර්ගයට අපදාන 10 ක් අයත් වේ.

1. **එකුපොසථිකාපදානය**
2. **සලලපුප්ඵිකාපදානය**
3. **මොදකදායිකාපදානය**
4. **එකාසනදායිකාපදානය**
5. **පඤ්චදීපදායිකාපදානය**
6. **සලමාලිකාපදානය**
7. **මහාප්‍රජාපතීගොතමී අපදානය**
8. **ඛෙමා අපදානය**
9. **උප්පලවණ්ණාපදානය**
10. **පටාචාරාපදානය** වශයෙනි.

මින් 7 වන මහාපජාපතී අපදානයට ගාථා 190 ක් අයත්වේ. එහි අන්තර්ගතය සංක්ෂිප්ත වශයෙන් මෙසේ ය.

- බුදුරදුන් විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩ වසන විට ප්‍රජාපතී ගෝතමී තෙරණිය ඇතුළු 500 ක් තෙරණීන්ට පරිනිර්වාණය සඳහා සිතුවිලි පහළවීම.
- එවිට භූමිකම්පා, නොකල් වැසි ආදිය ඇතිවීම.
- රහත් නොවූ ඇයගේ, වැළපීම්, ඉල්ලීම් ආදි තොරතුරු.
- බුදුරදුන් වෙත ගොස් වැරදිවලට සමාව ඉල්ලා පරිනිර්වාණය සඳහා අවසර ගැනීම.
- නන්ද, ආනන්ද, රාහුලාදි තෙරවරුන්ට පරිනිර්වාණය දන්වා සිටීම.
- ආනන්ද තෙරුන්ගේ වැළපීම.
- මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය රහත් බව ලැබ පෙළහර පෑ අයුරු.
- පදුමුත්තර බුදුන් සමයෙහි භික්ෂුණියක් චිරරාත්‍රඥ අග්‍ර තනතුරෙහි තබනු දැක ප්‍රාර්ථනා කිරීම.
- සසර කුසල් කොට දෙව්ලොව ශක්‍රයාගේ අගමෙහෙසිය වීම.
- බුදුන් දොරකොටුව තෙක් ජනකාය සමඟ ගෝතමිය අනුව යාම.

- ගෝතමී තෙරණිය ඇතුළු 500 ක් තෙරණිවරුන්ගේ පරිනිර්වාණය.
- මහී කම්පා වීම් ආදි ආශ්චර්යයන් සිදුවීම.
- ගෝතමී තෙරණිය ඇතුළු තෙරණිවරුන්ගේ ආදාහන පූජාව

මෙම තොරතුරු ඉතා විසිතුරු ලෙසත් සංවේග ජනක ලෙසත් පාලි ගාථාවන්ගෙන් ඉදිරිපත් කෙරේ.

**අභ්‍යාස**

i. 'අපදාන' යන්නෙහි අර්ථය ලියන්න.
ii. අපදානපාළිය ඛුද්දක නිකායේ කී වැනි ග්‍රන්ථය ද?
iii. අපදානවර්ග කීය ද? ඒ මොනවා ද?
iv. අපදානපාළියෙහි ඇතුළත් සියලු අපදාන සංඛ්‍යාව කීය ද?
v. අපදානපාළියෙහි ඇතුළත් ගාථා ගණන කීය ද?
vi. අපදානපාළියෙහි අටුවාවෙහි නම කුමක් ද?
vii. අපදානට්ඨකථාවේ කතුවරයා කවුද?
viii. අපදානපාළියෙහි ථෙරී අපදාන කීයක් ඇතුළත් ද?
ix. 'නවාංගසත්ථුසාසනය' නම් කරන්න.
x. මහා ප්‍රජාපතී ගෝතමී අපදානයෙහි ඇතුළත් ගාථා ගණන කීය ද?